


# මාධ්‍යවේදියෙකු සේ පැමිණි බුද්ධි අංශ නිලධාරියකු හමුවීම

### සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

මැයි මාසයේ 19 වන දිනයට අරුණලු පැතිරෙමින් තිබුණි. ටික දුරක් ගමන් කළ පසුව විශාල ශාලාවක මිනිසුන් දහස් ගණනින් ඉඳගෙන සිටිනු දක්කට ලැබුණි. ඒ සියලු දෙනාම සංවිධානයේ සටන්කාමීහුය. කාන්තාවෝ සහ පිරිමින්ව වෙන් වෙන්ව ලියාපදිංචි කරමින් සිටිනු නිරීක්ෂණයට ලක් විය. මේ වන විට වෙඩි පිපිරීම් නොඇසෙන දුරක අපි උන්නෙමු. වෙන්ව පැමිණි ඥාතීන්, හිතවතුන් පිළිබඳව සිතද්දී දරාගත නොහැකි වේදනාවකින් සිත දැවෙන්නට විය. එම ශාලාව තුළ සියලු දෙනාම සංවිධානයට අයත් අය වුවත්, හොඳින් දන්නා හඳුනන මුහුණු පිළිබඳව දෑස් යොමුකරන්නට වූයෙමි. එහෙත් කිසිවෙකු සමඟවත් කතා කළ යුතු යැයි සිතට දැනුණේ නැත. මා මෙන්ම බොහෝ දෙනෙක් සිත බිඳී නිහඬව සිටිනු මගේ අවධානයට ලක් විය.

සංවිධානයෙහි සිටි සෑම කෙනෙකුගේම සම්පූර්ණ විස්තර හමුදා බුද්ධි අංශය විසින් උනන්දුවෙන් යුතුව ලියාපදිංචි කර තනි ඡායාරූපයක් ද ලබාගන්නා ලදි. මේ අයුරින් සෑම කෙනෙක්වම ලියාපදිංචි කිරීමට අධික වේලාවක් ගත විය. හොඳින් දෙමළ කතා කළ හැකි හමුදා නිලධාරීන් විසින් ලියාපදිංචි කිරීම සිදුකරන ලදි. එදින දහවල් කාලයත් ගත වෙමින් පැවතිණි. තවත් අලුතෙන් පිරිස් පැමිණෙමින් උන්හ. ලියාපදිංචි කටයුතු අවසන් කළ පිරිස බස් රථවලට නංවා වෙනත් කොහේදෝ තැනකට යැවූහ. ඔවුන්ව පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට යවන බවට එහි සිටි අය පවසන්නට වූහ.

හමුදාවට සහයෝගයක් වශයෙන් දෙමළ තරුණයන් කීප දෙනෙකු දුව පැන වැඩ කරනු දක්නට ලැබිණ. ඔවුන්ගෙන් සමහරු පැවසූ නින්දා අවමන් සහිත වචන රිදුම් දෙන තුවාලවලට උණු තෙල් වක්කරන්නාක් මෙන් විය. ඉවසීමේ ඉහළ සීමාවට ගොස් හිත මූර්ජා තත්ත්වයෙහි තබා ගත්තෙමි. හෙමින් ඉදිරියට යන පෝලිමේ ගොස් ලියාපදිංචි කිරීමේ මේසය අසලට ළඟා වුණෙමි. එවිට "තමිළිනියක්කා, තමිළිනියක්කා" යැයි හොඳින් දන්නා අයෙකු ලෙසින් අමතනු ඇසී හැරී බැලුවෙමි. එම දෙමළ තරුණයන්ගෙන් එක් අයෙක් මට නැඟිට පැමිණෙන ලෙසින් සංඥා කළේය.

ඔහු සමඟ හමුදාවේ දෙදෙනෙක් එම ස්ථානයෙහිම උන්හ. සිදුවීමට නියමිතව ඇත්තේ කුමක්ද යන තැති ගැන්ම සමඟ මම එම ස්ථානයට ගියෙමි. මම තමිළිනී බව ඔවුන්ට නොසඟවා එය සත්‍යයක් බව දැනෙන්නට සැලැස්සුවෙමි. ඔවුහු මාව කෙලින්ම ලියාපදිංචි ස්ථානයකට කැඳවා ගෙන ගියහ. මගේ සම්පූර්ණ නම, ලිපිනය, සංවිධානයෙහි කටයුතු කළ කාලය ආදිය ඔවුහු සටහන් කර ගත්හ. මම කිසිම සැඟවීමකින් තොරව මගේ පුද්ගලික තොරතුරු ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළෙමි. මගේ ඡායාරූප ගත්හ. මා සත්‍යගරුකව සිටින තත්ත්වයක් තුළ යුද්ධයේදී භාර වන අයෙකුට හිමි වන යුක්තිය මට හිමිවනු ඇතැයි බලාපොරොත්තුව ආරම්භයෙහි සිටම මා තුළ යම්තාක් දුරකට තිබුණි.

මගේ තොරතුරු සියල්ල ලියාපදිංචි කිරීමෙන් පසුව මාව එම ශාලාවේ තැනක තනියම අසුන් ගන්නට සැලැස්විණි. මා සඳහා වන කටයුතු වෙනස් මුහුණුවරකින් සිදුවන බව මට අවබෝධ විය. පසුව එහි පැමිණි හමුදාවේ උසස් නිලධාරියෙක් මාව දුටු වහාම "වණක්කම් තමිළිනී" යැයි මා සමඟ ඉතාමත් හොඳින් පැවසුවේය. ඔහුව දුටු වහාම මා තුළ ඇති වූයේ කම්පනයකි. ඔහුව එයට පෙර කොහේදී හෝ හමුවී කතා කර ඇති බව මගේ මතකයට ආවේය. මොහොතකින් මට විදුලිය කෙටුවා සේ එම සිද්ධිය මතක් විය. සාම සාකච්ඡා පැවැති කාලයේදී වන්නියට පැමිණි ජනමාධ්‍යවේදීන් අතර කුමක්දෝ සිංහල ජනමාධ්‍යයක් වෙනුවෙන් මොහුද පැමිණ සිටියේය. ඔහු දේශපාලන අංශයේ භාරකරු ඇතුළු සංවිධානයේ වැදගත් තනතුරු දැරූ අය හමුවූ අතර, කිලිනොච්චියේ පිහිටුවා තිබූ දේශපාලන අංශයෙහි කාන්තා අංශයෙහි ලේකම් කාර්යාලයේ දී මාව ද මුණ ගැසුණි.

ඉතාමත් හොඳින් දෙමළ භාෂාව කතා කිරීමට හැකියාව ඇති ඔහු අරගලයට හිතෛෂී පුද්ගලයෙක් යන මුහුණුවරින් බොහෝ සටන්කාමීන් සමඟත්, අංශ භාර අය සමඟත් මහත් හිතවත්ව සමීපව ඇසුරු කළ මතකයන් මා තුළ අලුත් විය. එපමණක් නොව, පළමු කාන්තා වීරවරිය වූ මාලතීගේ අනුස්මරණ දිනය 2000 වසරේදී කිලිනොච්චියේ දී පැවැත්වූ මොහොතේ ඔහුද එයට සම්බන්ධ වී ජනමාධ්‍යවේදියෙකු ලෙසින් හඳුන්වා දෙමින් මහත් හිතවත්ව බොහෝ කරුණු පිළිබඳව සාකච්ඡා කළ අන්දම මගේ සිහියට නැඟුණි. එම හමුදා බුද්ධි අංශ නිලධාරියා කොයිතරම් සූක්ෂම ලෙසින් කොටින්ගේ බුද්ධි අංශයට වැලි ගසා කිලිනොච්චියේ හන්දියක් අස්සක් මුල්ලක් නෑර සැරිසරා ඇත්දැයි මම මහත් තිගැස්මෙන් යුතුව සිහියට නඟා ගත්තෙමි. කුමන අන්දමේ උපක්‍රම භාවිතා කරමින් කොටි පාලන ප්‍රදේශයන්ට හමුදාවේ බුද්ධි අංශය රිංගා ගෙන ඇති ද යන සත්‍ය තේරුම් ගැනීමට මෙයම මට හොඳ සක්ෂියක් විය.

මා විසින් ඔහු හඳුනාගනු ලැබූ බව හමුදා බුද්ධි අංශ නිලධාරියා ද තේරුම් ගත්තේය. ඔහු මා සමඟ ඉතාමත් ආචාරශීලීව කතා බහ කළේය. "තමිළිනී, ඔයා බයවෙන්ඩ එපා. අනෙක් අය වගේ ඔයාවත් දැන් අපිට පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යවන්ඩ බෑ. ඔයා විමුක්ති කොටි සංවිධානයේ වගකීම් භාර තනතුරක් දරලා තිබෙන නිසා ඔයාගෙන් සමහර කරුණු ගැන ප්‍රශ්න කිරීමේ අවශ්‍යතාවක් තියෙනවා. ඒ නිසා ඔයාව සී.අයි.ඩී. එකට බාර දෙනවා. ඔයා සම්බන්ධයෙන් නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට නියමිතයි." යැයි ඔහු පැවසුවේය.

ඊට පසු පැය ගණනක් නැවතත් මා එම ලියාපදිංචි කිරීමේ ශාලාවේ තනියම අසුන් ගැන්වීමට සළස්වා තැබූ අතර, ඊළඟට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව සිතීම මම හැකිතරම් වළක්වා ගැනීමට උත්සාහ කළෙමි. අප්‍රාණික වස්තුවක් සේ එම ස්ථානයෙහි හිඳගෙන මම ඇසට ලක්වෙන දර්ශන දෙස හිස් බැල්මෙන් යුතුව උන්නෙමි. කිසිම දෙයක් මොළයට රැගෙන ගොස් විමසා බලා තීරණ ගැනීමේ ශක්තිය මම මුළුමනින්ම අහිමිව උන්නෙමි.

දෙමළ තරුණයෙක් එදින පුවත්පතක් ගෙනැවිත් එහි වූ ඡායාරූප සියලු දෙනාට පෙන්නුවේය. නායකතුමාව මරා දැමීමේ පුවතට අදාළ දර්ශන එම ඡායාරූපවලින් පෙන්නුම් කළේය. "උඹලගේ නායකයා මළා. අඬපල්ලා සේරම." යැයි පැවසූ ඔහු සමච්චල් සහගතව අඬා පෙන්නුවේය. ශාලාව තුළ සිටි සියලු දෙනාගෙන්ම එක්වරම කුඩා හඬක් මතුවී සැනෙකින් එය යටපත්ව ගියේය. ගෞරවනීය අය්යා ලෙසින්ද, සෙනෙහෙබර පියා ලෙසින්ද, දෑස් ඉදිරිපිට සිටින දෙවියන් ලෙසින් ද, සටන්කාමීන් තම හදවත් තුළ දැඩිව දරාගෙන සිටියේ කුමන මිනිසා ද, කුමන මිනිසා ගේ වචන දිව්‍යමය මන්ත්‍ර සේ ක්‍රියාත්මක කළේ ද එම මිනිසාගේ මරණය පිළිබඳව පුවත නොඇසූවන් සේ සිටීමට උත්සාහ ගත් එම වාතාවරණය තේරුම් කර දීම ඉතාමත් දුෂ්කරය. එහි උන් සෑම සටන්කාමියෙකුගේම මුහුණු යකා ගැහුවා සේ වෙනස්ව තිබුණි.

කොටි සංවිධානයේ නායකතුමා විසින් කරන ලද අවසාන සැළැස්ම පිළිබඳව දැනගෙන සිටි අයට නන්දිකඩාල් කලපුවෙහි දී සිදුව ඇත්තේ කුමක්ද යන්න එම පුවත මගින් තේරුම්ගත හැකි විය. එහෙත් කිසිවෙකුත් කට ඇර කිසිවක් කතා කළේ නැත. මේ වන විට සියලු දෙනාම තනි පුද්ගලයන් වන හෙයින්, පවතින තත්ත්වය තවදුරටත් දුෂ්කර තත්ත්වයට පත් නොකර ගෙන සිටීමට සිතුවා විය හැකිය.

